

# වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

## 2021.10.14

දින පැවති මහ සභාවේදී සම්මත
කරගෙන ඇති

# අභ්‍යන්තර ප්‍රතිපත්ති

මාලාව

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

Made with PosterMyWall.com

වයඹ අභිමානය

# පෙරවදන...

වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ ජන ජීවිතය සුබිත මුදිත කරලීම සඳහා 1987 අක 15 දරණ ප්‍රාදේශීය සභා පණතේ විධි විධාන වලට අනුකූලව හා සම්මත අතුරු ව්‍යවස්ථා වලට අනුව සේවා සැපයීම සඳහා 2021.09.06 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව විසින් නිර්දේශ කර ගත් ප්‍රතිපත්ති 2021.10.14 වන දින පැවති 43 වන මහා සභාව මගින් අනුමත කර ගනිමින් පහත සඳහන් පරිදි ප්‍රතිපත්ති සකස් කර ඇත.

01. *වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ කටයුතු සඳහා කාන්තා නියෝජනය ලබා දීම සඳහා වන ප්‍රතිපත්ති*

02. *සභාව සතු පොළ භූමි සහ වෙළෙඳ පොළ අවකාශයන් ලබා දීම සම්බන්ධයෙන් වූ ප්‍රතිපත්ති*

03. *අවිධිමත් ව්‍යාපාර ආවරණය කිරීමේ ප්‍රතිපත්ති.*

04. *අවිධිමත් පදිංචිකරුවන් සහ අවතැන් වූවන් ආවරණය කිරීමේ ප්‍රතිපත්ති.*

05. *වරප්‍රසාද නොලත් කණ්ඩායම් සවි බල ගැන්ම සඳහා වන ප්‍රතිපත්ති.*

06. *ආබාධිත පුරවැසියන් ආවරණය කිරීම සඳහා වන ප්‍රතිපත්ති*

07. *ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට විශේෂ අවශ්‍යතා විධි විධාන පිරිනැමීම සඳහා වන ප්‍රතිපත්ති.*

08. *වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ පරිසර ප්‍රතිපත්ති*

09. *වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුලදී ක්‍රියාත්මක කල යුතු ප්‍රතිපත්ති*

10. *ජල සහ සනීපාරක්ෂක ප්‍රතිපත්ති*

වෙන්නප්පුව ප්‍රාදේශීය බල ප්‍රදේශයේ ජනතාව මෙන්ම සභා බල ප්‍රදේශයේ සේවා සපයා ගන්නා සෙසු ජනතාවටද මහෝපකාරී වන ආකාරයට ප්‍රාදේශීය සභා පනත් හා අතුරු ව්‍යවස්ථා වලට අනුකූලව සකස් කරන ලද ඉහත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරමින් සේවා ඉටුකිරීම සඳහා ඔබගේ මනා සහයෝගය අපේක්ෂා කරමු.

ඉහත ප්‍රතිපත්ති වල යම් වෙනසක් සිදු විය යුතු නම් ඒ බව අපව දැනුවත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

# දැක්ම

"පහසුකම් සපිරි යහ පාලිත පුරවරයක් "

# මෙහෙවර ප්‍රකාශය

වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ
ජන ජීවිතය නංවාලීම උදෙසා පහසුකම් සපයමින්
සභාව සතු සම්පත් හා අනෙකුත් ආදායම් ආධාර
යහපාලනයෙන් යුක්තව, කාර්යක්ෂමව හා ඵලදායීව
කලමනාකරණය කර පුළුල් ජනතා සහභාගීත්වයකින්
උපරිම සේවාවක් සැපයීම.

# පටුන..

පිටු අංක


| | |
|---|---|
| වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ කටයුතු සඳහා කාන්තා නියෝජනය ලබා දීම සඳහා වන ප්‍රතිපත්ති | 04 |
| සභාව සතු පොල භූමි සහ වෙළෙඳ පොළ අවකාශයන් ලබා දීම සම්බන්ධයෙන් වූ ප්‍රතිපත්ති | 05 – 06 |
| අවිධිමත් ව්‍යාපාර ආවරණය කිරීමේ ප්‍රතිපත්ති. | 07 |
| අවිධිමත් පදිංචිකරුවන් සහ අවතැන් වුවන් ආවරණය කිරීමේ ප්‍රතිපත්ති. | 08 |
| ආබාධිත පුරවැසියන් ආවරණය කිරීම සඳහා වන ප්‍රතිපත්ති | 09 |
| වරප්‍රසාද නොලත් කණ්ඩායම් සවිබල ගැන්ම සහ වන ප්‍රතිපත්ති. | 10 |
| ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට විශේෂ අවශ්‍යතා විධි විධාන පිරිනැමීම සඳහා වන ප්‍රතිපත්ති. | 11 |
| වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ පරිසර ප්‍රතිපත්ති | 12 |
| වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළදී ක්‍රියාත්මක කල යුතු ප්‍රතිපත්ති | 13 |
| ජල සහ සනීපාරක්ෂක ප්‍රතිපත්ති. | 14 |

# වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ කටයුතු සඳහා කාන්තා නියෝජනය ලබා දීම සඳහා වන ප්‍රතිපත්ති

මීට වසර ගණනාවකට පෙර සමාජය තුළ කාන්තාවකට නිසි තැන ලැබී තිබුණේ නැත. බොහෝ අවස්ථාවලදී කාන්තාව නොසලකා හැරිය තත්ත්වයකට නැතිනම් සමාජයේ දෙවැනි තැන තබා කටයුතු කරන බවත් දක්නට ලැබුණි. එම තත්ත්වය අද වන විට එදා තරම්ම නොවුණත් යම් යම් අවස්ථා අඩු වැඩි වශයෙන් ක්‍රියාත්මක වේ. ඒ අනුව තවමත් සම්පූර්ණයෙන්ම කාන්තාවට සමාජය තුළ ලැබිය යුතු ස්ථානය නිසි ලෙස ලබා දී නොමැත. මෙහි ප්‍රතිඵල ලෙසින් කාන්තා හිංසනය, කාන්තා අයිතිවාසිකම්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අපට කතා කිරීමට සිදුව ඇත. මේ තත්ත්වය සමනය කර ගනිමින් වඩාත් හොඳ ප්‍රවේශයක් ලබා දීමේ අරමුණින් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව අපගේ කටයුතු සඳහා කාන්තා නියෝජනත්වයක් ලබා දීම සම්බන්ධ ප්‍රතිපත්තියක් හැටියට තීරණය කර ඇත. ඒ අනුව පහත ප්‍රතිපත්තීන්හි පිහිටුවා වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව කටයුතු කරනවා ඇත.

## කාන්තා නියෝජනය ලබා දීමට අදාල නෛතික විධි විධාන

පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍ර ලේඛ අංක 11 හි 3.03 වගන්තිය

1. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ප්‍රජා සංවර්ධන පරිසර හා පොදු පහසුකම් යන ස්ථාවර කමිටුවලට අවම වශයෙන් 25% ක කාන්තා නියෝජනත්වයක් ඇතිවන ආකාරයට සාමාජිකයින් පත් කිරීම.

2. සභාවේ අනිකුත් උපදේශන කාරක සභාවලටද අවම වශයෙන් 25%ක කාන්තා නියෝජනත්වයක් ලබා දීම.

3. කාන්තාව සවි බල ගැන්වීම, කාන්තා හිංසනය අවම කිරීම, දරිද්‍රතාවය අවම කිරීම කාන්තාවට ගෘහස්ථ සමාජය තුළ අනුන්ගෙන් යැපෙන තත්ත්වයෙන් මුදවාගෙන ස්වයංව නැඟී සිටීමට හැකි තත්ත්වයක් ඇති කිරීම අරමුණු කරගෙන සුදුසු වැඩසටහන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් වාර්ෂිකව අඛණ්ඩව සැලසුම් කර පවත්වාගෙන යාම.

4. කාන්තාවට සමාජය තුළ ලැබිය යුතු නිසි තැන ලබා දීම සඳහා කාන්තාවට සමාජයෙන් එල්ලවන හිංසනය අවම කරලීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විශේෂයෙන්ම පුරුෂ පාර්ශවය දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

5. ප්‍රාදේශීය සංවර්ධන ක්‍රියාවලියට කාන්තාව හවුල් කර ගැනීම සඳහා කාන්තා සංවිධාන, කාන්තා නියෝජනත්වයක් ඇති ප්‍රජා සංවර්ධන කොට්ඨාස මට්ටමින් ගොඩනැංවීම හා ඒවා සමග මනා සම්බන්ධ කරණයක් පවත්වා ගෙන යාම.

6. වාර්ෂික අයවැය සකස් කිරීමේ දී හා වාර්ෂික සැලසුම් සැකසීමේ දී කාන්තාවන්ගේ / කාන්තා සංවිධාන වල අදහස් උදහස් යෝජනා ද විමසීම හා ඔවුන්ගේ යෝජනා ඒ තුළ ඉඩක් ලබා දීම.

7. ජාත්‍යන්තර කාන්තා දිනය, ජාත්‍යන්තර දියණියන්ගේ දිනය වැනි කාන්තාවන් වෙනුවෙන් වෙන් වූ විශේෂිත දින අලලා ඒ සම්බන්ධව සමාජයට පණිවිඩයක් දිය හැකි ආකාරයේ වැඩසටහන් සභාවේ මැදිහත්වීම මත ක්‍රියාවට නැංවීම.

8. වෙළෙඳපොල අවස්ථා (Opportunities) ලබා දීමේ දී කාන්තා ව්‍යාපාරික ප්‍රජාව මූලික කොට සැලකීම.



<u>සභාව සතු පොල භූමි සහ වෙළෙඳපොළ අවකාශයන් ලබා දීම සම්බන්ධයෙන් වූ ප්‍රතිපත්ති</u>

**වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව සතුව සතිපොළ 05 ක් සහ වෙළඳපොළ පරිශ්‍ර 09 ක් ඇත. මේවා පවත්වාගෙන යාම තුළින් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට ප්‍රධාන වශයෙන් අරමුණු දෙකක් ඉටුකර ගැනීමට හැකියාව ලැබී ඇත.**

## සභාව සතු පොල භූමි සහ වෙළෙඳපොළ අවකාශයන් ලබා දීමට අදාල නෛතික විධි විධාන

(අ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 119 – 121 දක්වා වගන්ති

(ආ) 1988 පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 33 වන අතුරු ව්‍යවස්ථාව

1. ඒ අනුව මේ තුළින් සභාවේ සේවා සම්පාදනය සඳහා අවශ්‍ය අරමුදල් සම්පාදන ක්‍රියාවලියට ප්‍රබල දායකත්වයක් ලබා ගැනීමට හැකියාව ඇති අතරම බල ප්‍රදේශය තුළ පවත්වන විශාල පිරිසක් මේ ආශ්‍රිතව ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම තුළින් තම ආර්ථිකය ද සවිමත් කරගනී.

   ඒ තුළින් සභාවක් හැටියට අප ස්වයං රැකියා අවස්ථා රැසක් නිර්මාණය කරදීමේ සුවිශේෂී සමාජ මෙහෙවරකට උරදෙන්නට හැකියාවද ලැබී ඇත.

2. මෙම ස්වයං රැකියා අවස්ථා නිර්මාණය කිරීම තුළින් අප විසින් ඉටු කරනු ලබන්නා වූ සමාජ මෙහෙවර තව දුරටත් වර්ණවත් කිරීම උදෙසා මෙහි බල ප්‍රදේශයේ ජීවත් වන කාන්තා වෙළෙඳ හිමකරුවන් විශේෂ අවශ්‍යතා සහිත අය, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, විශේෂයෙන්ම ප්‍රාදේශීය වෙළඳුන් සහ නිෂ්පාදකයින් සහ තමන්ට කියා ව්‍යාපාරයක් පවත්වා ගෙන යාමට තරම් පරිශ්‍රයක් නොමැති එහෙත් කිසියම් හෝ වෙළඳාමක් කරගෙන යාම අපේක්ෂාවෙන් සිටින හා වාර්ගික බෙදීම අනුව හස්ත කර්මාන්ත වැනි ව්‍යාපෘතීන් වලට කර්මාන්ත වලට යොමුවූ ජන කොට්ඨාසද, ධීවර ජනතාව ඇතුළු අවධානමට ලක්වූ පිරිස් කෙරෙහිද අවධානය යොමු කරවා ඔවුනටද ඉඩ කඩක් ලබාදීම සුදුසු බවට මෙම සභාව ප්‍රතිපත්තියන් ලෙස පිළිගනී.

3. මෙම පිරිස් සඳහා ඉඩකඩ ලබාදීමෙන්ද විශේෂයෙන් අප හා සම්බන්ධ වී කටයුතු කරන කාන්තා සංවිධාන සාමාජිකාවන්ට පළමුව ප්‍රමුඛතාවය ලබාදී ඉන් අනතුරුව අඩු ආදායම්ලාභී විශේෂයෙන්ම කාන්තා මූලික පවුල් වල කාන්තාවන්ට අවස්ථාවන් ලබා දීමටත්, ප්‍රතිපත්තියක් හැටියට තීරණය කර ඇත.

4. අපගේ බල ප්‍රදේශය තුළ වෙසෙන ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට මෙන්ම ආබාධිත තත්ත්වයට පත්ව අසරණ තත්ත්වයෙන් පසුවන පුරවැසියන් රැසක් සිටින බැව් අපි දනිමු. මෙම පිරිසට ද කිසියම් කර්මාන්තයක නියැලි තම ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට ශක්තියක් නොමැති බැවින් ඔවුන්ට කිසියම් හෝ ඉඩකඩ ලබාදීම සුදුසු බවට මෙම සභාව පිළිගන්නා හෙයින් පළමුව ආබාධිත පුරවැසියන්ටද දෙවනුව ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ද ඉඩකඩ ලබාදීම පිළිගනී.

5. ප්‍රාදේශීය ව්‍යවසායකයින් යනු අප සභා බල ප්‍රදේශයට මෙන්ම සමස්ථයක් හැටියට ගත් කළ ජාතික වශයෙන් ද රටේ ආර්ථිකය ස්ථාවර කරන්නට වෙහෙසෙන හා තමන් සතු අරමුදල් ආයෝජනය තුළින් කැපවීමෙන් සංවර්ධන ක්‍රියාවලියට දායක වන අපගේම පිරිසකි. ඔවුන්ගේ නිපැයුම් අලෙවි කිරීමට ඉඩකඩ ලබාදීම තුළින් ඔවුන්ව දිරිමත් කිරීමට අපට හැකිය. එවැනි පිරිස් සඳහා අපි අපගේ වෙළඳ පරිශ්‍රයන් තුළ ඉඩකඩ වෙන් කිරීමේදී ඊළඟ ප්‍රමුඛතාවය ලබා දීමටත් එහිදී දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදී සිටින්නන් හට ප්‍රමුඛතාවය ලබාදීම සුදුසු බවට පිළිගනී.

6. ආර්ථික අර්බුද හමුවේ, එසේ නොමැති නම් තමන්ගේ ව්‍යාපාර කටයුතු කරගෙන ගිය ස්ථානය තමන්ට අහිමි වීම, අවතැන්වීම සහ මෙම ප්‍රදේශයට සංක්‍රමණය වූ පුද්ගලයන් ඇතුළුව අවධානමට ලක් වූ පිරිස් කෙරෙහිද අවධානය යොමු කරවමින් ඒ සියල්ලන් සඳහාම හැකි උත්සාහයක් ගත යුතු බවට පොදුවේ පිළිගනී.

7. ඒ අනුව කාන්තා කණ්ඩායම් සඳහා 10% ක්ද, විශේෂ අවශ්‍යතා හා ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා 10% ක්ද, අවධානමට ලක්වූවන් සඳහා 10% ක්ද, අවම අගයකට අනුව ඉඩකඩ වෙන් කර දීමටත්, ඊට අමතරව ප්‍රාදේශීය ව්‍යවසායකයන් සඳහා වැඩි ඉඩකඩක් ලබාදීමේ වැඩපිළිවෙළකට අනුගත වීම සුදුසු බව ප්‍රතිපත්තියක් ලෙස පිළිගනී.



**සභා බල ප්‍රදේශය තුළ දැනටමත් පවත්වාගෙන යනු ලබන හා ඉදිරියේදී බිහි විය හැකි අවිධිමත් ව්‍යාපාර පිළිබඳ ගැටළුව එක් අතකින් සමාජීය ප්‍රශ්නයක් මෙන්ම තවත් අතකින් නෛතික ගැටළුවක් බවට පත්ව ඇත. එහෙත් මෙම ක්ෂේත්‍රයේ යෙදෙන්නන් බොහෝමයක්ම ස්වයං රැකියාවක් හැටියට එදිනෙදා දෛනික ජීවිතය ගෙවා ගන්නට මේ තුළින් කිසියම් හෝ ආදායමක් ලබා ගන්නා බව අපි දනිමු. ඒ නිසාම මොවුන්ව අමතක කර හෝ ඔවුනට මුහුණු දීමට සිදුවන ගැටළු අමතක කර හෝ කටයුතු කළ නොහැක. ඒ නිසාවෙන් අපි අවිධිමත් ව්‍යාපාර නියාමනයට සහ ආවරණය සඳහා වන වැඩපිළිවෙළ ක්‍රියාවට නැංවිය යුතු බවට ප්‍රතිපත්තියක් ලෙස පිළිගනුව ඇත.**

## අවිධිමත් ව්‍යාපාර ආවරණය කිරිමේ ප්‍රතිපත්තියට අදාල නෛතික විධි විධාන

(අ) 1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව)

2010.07.16 දිනැති අංක 1663 දරණ ගැසට් නිවේදනය

1. **පළමුව සභා බල ප්‍රදේශය තුළ ඇති අවිධිමත් ව්‍යාපාර ස්වභාවය හඳුනා ගෙන ඒවා විධිමත් කිරීම උපදේශනය මඟින් යථාවත් කිරීමට ඇති හැකියාව සොයා බලා ඒ සඳහා වන වර්ගී කරණයක් ලබා ගන්නවා ඇත.**

2. **විධිමත් ස්ථාන වල එහෙත් අවිධිමත්ව ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යන ව්‍යාපාරකයින් දැනුවත් කර ඒවා විධිමත් කිරීමට පියවර ගන්නවා ඇත. ඊට අවනත නොවී කටයුතු නොකරන්නේ නම්, නෛතික ක්‍රියා මාර්ග වගට එළඹීමටද පසුබට නොවනු ඇත. උදාහරණ ලෙස, සිල්ලර බඩු, ආහාර ද්‍රව්‍ය, රසායන ද්‍රව්‍ය වැනි විවිධ වූ භාණ්ඩ වර්ග එකට තබාගෙන අලෙවි කරන අවස්ථා ඇත. ඒ සම්බන්ධව සොයා බලා අවශ්‍ය උපදෙස් සහ මහපෙන්වීම් ලබා දෙමින් එම අවිධිමත් තත්ත්වය වළක්වා ලිය යුතු බවට මෙම සභාව පිළිගන්නවා ඇත.**

3. **මාර්ග දෙපස මඩ වගුරු වැනි අපිරිසිදු ස්ථාන වල ආහාර ද්‍රව්‍ය අලෙවි කරන අවස්ථා ඇත. ඒ අවස්ථා හඳුනාගෙන ඔවුනට ආරක්ෂාකාරි ලෙස හා සෞඛ්‍ය ආරක්ෂිත ලෙස ඒවා පවත්වා ගෙන යාමට අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් වලට අමතරව අදාළ අයට එම ජංගම වෙළෙදාම පවත්වා ගැනීමට සහ ජංගම වෙළඳ කුටි සකසා සභාව විසින් සාධාරණ ගාස්තුවක් අයකර ගැනීමේ පදනමින් සැපයීම සුදුසු බවටත් ඒ සඳහා පියවර ගත යුතු බවටත්, එමඟින් සභාවේ ආදායම් ප්‍රවාහයට උත්තේජනයක් ලබා දීමටත්, ස්වයං රැකියාවක් සඳහා ආධාර අනුබල දීමටත් හැකියාව ලැබෙනු ඇති බවට සභාව පිළිගනී.**

4. **විශේෂයෙන්ම සංචාරක වෙළඳාමේ නියුතු ආහාර අලෙවි කරන්නන් සම්බන්ධව සොයා බලා ඔවුන්ගේ අලෙවි රථ ක්‍රමානුකූලව සකස් කර දීමට අවශ්‍ය මඟ පෙන්වීම් කළ යුතු බවටත් සභාව පිළිගන්නවා ඇත.**

මහා මාර්ග දෙපස, රජයට අයත් භූමි භාග වල ජංගම වෙළඳාමේ නියුතු පුද්ගලයින් හඳුනාගෙන ඔවුන්ට එම ව්‍යාපාර කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යන ආකාරයට අවශ්‍ය සහය අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ එක්ව ලබාදීම සඳහා මහා මාර්ග දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වැනි රාජ්‍ය ආයතන සමඟ කටයුතු කළ බවට ප්‍රතිපත්තියක් ලෙස පිළිගනී.



# අවිධිමත් පදිංචිකරුන් සහ අවතැන්වූවන් ආවරණය කිරීමේ ප්‍රතිපත්තිය

**අවිධිමත් පදිංචිකරුවන් සහ අවතැන්වූවන් යන කාරණා දෙකම එකිනෙකට බැඳී පවත්නා කාරණාවන් වෙති. අවතැන්වූ පුද්ගලයින් කෙසේ හෝ කුමන ස්ථානයක හෝ පදිංචි වීමට උත්සාහ ගනී. ඒ සෑම අවස්ථාවකම ඔවුන්ව නිරායාසයෙන්ම අවිධිමත් පදිංචිකරුවන් බවට පත් වේ. බොහෝ අවස්ථා වල වෙරළ ආශ්‍රිතව පහත් බිම් වල ජල මූලාශ්‍ර ආශ්‍රිතව මේ ආකාර පදිංචිකරුවන් සිටින බව අපි දනිමු. එම තත්ත්වය බරපතළ සමාජීය ගැටළුවකි. එය මඟ හැරීම සඳහා අපද මැදිහත්විය යුතු හෙයින් ඒ සඳහා විය යුතු ප්‍රතිපත්තියක් මෙසේ සකස් කොට ක්‍රියාත්මක කළ යුතු බව පිළිගනී.**

## අවිධිමත් පදිංචිකරුවන් සහ අවතැන්වූවන් ආවරණයට අදාල නෛතික විධි විධාන

(අ) 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනත

(ආ) නිවාස හා නගර සංවර්ධන ආඥා පනත

1. බල ප්‍රදේශයේ අවිධිමත් පදිංචිකරුන් සහ අවතැන්වූවන් හඳුනාගෙන නියාමනය කිරිම සඳහා වූ වැඩපිළිවෙළකට අප විසින් යා යුතු බව පිළිගනී.

2. සභා බල ප්‍රදේශය තුළ ගොඩනැගිල්ලක් ඉදි කිරීමේදී ඒ සඳහා අනුමැතියක් සභාව වෙතින් ලබාගත වුවත්, එසේ අනුමැතිය ලබා නොගෙන ඉදි කිරීම තුළින්ද මෙම තත්ත්වය ඇති විය හැකි බවට සභාව හඳුනාගෙන ඇත. උදාහරණ ලෙස වැසිකිළි ඉදි කිරීම, ලිං ඉදි කිරීම, ඉදි කරන ගොඩනැගිල්ලට වාතාශ්‍රය නොලැබීම, අප ජලය බැස යාමට ක්‍රමයක් නොමැති වීම, කසල බැහැර කිරීමට වැඩපිළිවෙලක් නොමැති වීම, ප්‍රමාණවත් ඉඩකඩක් නොමැති ස්ථාන වල පදිංචි නිවාස ඉදි කිරීම නිසා මෙම ගැටළුව උග්‍ර විය හැකිය. එම තත්ත්වයන් සම්බන්ධව සොයා බැලීමටත්, හඳුනාගත් අයට අවශ්‍ය මඟපෙන්වීම් ලබා දීමටත්, ඉදි කිරීම් සම්බන්ධව නියාමනයක් ඇති කිරීම සුදුසු බවටත් සභාව පිළිගන්නවා ඇත.

3. බල ප්‍රදේශය තුල වෙනත් රාජ්‍ය ආයතන වලට අයත් රක්ෂිත වල පදිංචි වී සිටින දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් රක්ෂිත වල පදිංචිකරුවන්, වෙරළ රක්ෂිත වල පදිංචිකරුවන් සඳහා ඍජු කාලීන වැඩපිළිවෙලක් හැටියට නිවාස යෝජනා ක්‍රම ආරම්භ කර ඔවුනට ලබාදී එමඟින් ඔවුන්ගේ නිවාස ගැටළු විසඳීමට මෙන්ම එමඟින් සභාවට ආදායම් උත්පාදන මාර්ගයන් විවර කර ගැනීමට ඇති හැකියාව සම්බන්ධවද මේ සඳහා පෞද්ගලික අංශයේ සහභාගීත්වය ලබා ගැනීමටද ඇති හැකියාව පිළිබඳව සොයා බැලිය යුතු බවට ප්‍රතිපත්තියක් ලෙස මෙම සභාව පිළිගනී.

4. සභාවේ ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලයට අමතරව අනෙකුත් රාජ්‍ය ආයතන වල සහයෝගයද ලබා ගනිමින් අවිධිමත් පදිංචිකරුවන් හඳුනා ගැනීම හා ඉදිරියේදී එවැනි අවස්ථාවන් ඇති වීම වළක්වා ගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු බවද පිළිගනී.

5. පදිංචි නිවාස, කර්මාන්ත ශාලා, සත්ව ගොවිපල, කෘෂි ව්‍යාපෘති ආදිය එකම පරිශ්‍රයක ආරම්භ කිරීමට ඇති ඉඩකඩ සඳහා පාරිසරික ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කර මෙම තත්ත්වය මහ හරවා ගැනිමට පියවර ගත යුතු බවට මෙම සභාව පිළිගනී.

# ආබාධිත පුරවැසියන් ආවරණය කිරීම සඳහා වන ප්‍රතිපත්තිය

## ආබාධිත පුරවැසියන් ආවරණය කිරිම සඳහා අදාල නෛතික විධි විධාන

(අ) 1996 අංක 26 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරිමේ පනත

(ආ) 2006.10.17 සහ අංක 1467/15 දරණ ගැසට් නිවේදනය.

(ඇ) නාගරික සංවර්ධන ඉදිකිරිම් සහ නිවාස අමාත්‍යාංශය මගින් ලබා දෙන ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ කොන්දේසි

(ඉ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 19 (xxiii) වගන්තිය

1. ආබාධිත එසේත් නොමැති නම් විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් යනු අපගේම සහෘදයින් කොටසක් සේ සලකා ඔවුන්ටද සමානව ප්‍රතිලාභ බෙදී යාමට හැකි ලෙස කටයුතු සැලසුම් කිරිම ක්‍රියාවට නැංවීම ප්‍රතිපත්තියක් ලෙස පිළිගනී.

2. සභාව විසින් ක්‍රියාවට නංවන ආධාර වැඩසටහන් සහ සහනාධාර සැපයුම් වැනි වැඩසටහන් වලදී ප්‍රමුඛතාව මෙම පිරිසට ලබා දිය යුතු බවට පිලිගන්නවා ඇත.

3. සභාව සතු සෑම පොදු ස්ථානයකටම බාධාවකින් තොරව පිවිසිය හැකි ආකාරයට එනම් රෝද පුටුවක් වැනි උපකරණයක් භාවිතා කර පැමිණීමට හැකි ලෙසට පිවිසුම් මාර්ගයක් සැකසීම හා ඒ ස්ථාන අසල රෝද පුටු තබා තිබීම සුදුසු බවට පිළිගනී.

4. ආදායම් උත්පාදන ස්වයං රැකියා ප්‍රතිලාභීන් ක්‍රියාත්මක කිරීමේදී අඩු ආදායම්ලාභීන්ට ප්‍රමුඛතාව ලබා දෙන ආකාරයෙන්ම මෙම පිරිසට ද ප්‍රමුඛත්වයක් ලබා දිය යුතු බවට පිළිගනී. උදාහරණ ලෙසට ආබාධිත පුරවැසියන් වෙත ජංගම සංචාරක වෙළඳාම බාධාවකින් තොරව පවත්වාගෙන යාමට හැකි අයුරින් අවශ්‍ය උපකරණ හැකි අයුරින් ලබාදීම සභාව පිළිගනී.

5. සභාව සතු පොදු ගොඩනැගිලි වල ආබාධිතයින් සඳහා පහසුකම් සැලසෙන ආකාරයේ වැසිකිළි පහසුකම් සැකසීම සභාව පිළිගනී.



## වරප්‍රසාද නොලත් කණ්ඩායම් සවිබල ගැන්ම සහ වන අභ්‍යන්තර ප්‍රතිපත්ති.

වයඹ හා බස්නාහිර යන පළාත් දෙක එකිනෙකට මුනගැසෙන පළාත් මායිමෙහි ස්ථාපිත වයඹ පළාතේ විශාලතම එමෙන්ම කාර්ය බහුලතම පළාත් පාලන ආයතනය ලෙස සැලකෙන වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව පළාත තුළ පිහිටි අනෙකුත් ප්‍රාදේශීය සභා 28 ටම ආදර්ශයක් වන අයුරින් කටයුතු කරමින් සභා බල ප්‍රදේශයේ ජනතාවට හැකි සෑම අයුරකින්ම උපරිම සේවාවක් සපයමින් අපගේ සහෘද ජනතාවගේ ජීවිත සැපවත් කිරීමට හැකි වන ලෙසින්, යටිතල පහසුකම් සංවර්ධන ක්‍රියාවලිය පවත්වාගෙන යාම අපගේ එක් අරමුණක් විය යුතුයි යැයි සඳහන් කරමි. මෙහිදී මා ඇතුළුව සමස්ථ ගරු සභාවම මෙහි භාරකරුවන් හැටියට බල ප්‍රදේශයේ ජනතාවගේ අයිතීන් සුරක්ෂිත කරලීම උදෙසා ඔවුනගේ ඕනෑ එපාකම් සොයා බලා ඒවාට විසඳුම් ලබාදීමට අවශ්‍ය පියවර ගනිමින් සිටිමු. ඒ සඳහා වන සැලසුම් සැකසීම සහ ඒවා ජනතාවාදී ලෙසින් ක්‍රියාවට නැංවීමද අප විසින් අනිවාර්යයෙන්ම කළ යුතුව ඇත. ඒ අනුව,

### වරප්‍රසාද නොලත් කණ්ඩායම් සවිබල ගැන්වීම සඳහා අදාල නෛතික විධි විධාන

(අ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 19 (xxiii) උප වගන්තිය

(ආ) පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍ර ලේඛ අංක 11 හි 3.05 වගන්තිය

1. විශේෂයෙන්ම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජීවත් වන විපී දරුවන්, යාචකයින්, දුගී ජනයා ආදී වරප්‍රසාද නොලත් අය වෙනුවෙන් අයවැය ප්‍රතිපාදන සැලසීම.

2. අප ආයතනය වෙත සේවා පහසුකම් ලබා ගැනීම සඳහා නන් දෙසින් පැමිණෙන වරප්‍රසාද නොලත් පුරවැසියන් සඳහා ආයතනයේ ගෞරවාදර සහයෝගය ලබාදී කටයුතු කිරීමටද,

3. සභා බල ප්‍රදේශය තුළ තමන්ගේම කියා සුදුසු වාසස්ථාන නොමැතිව ඉතාමත් අඩු පහසුකම් යටතේ ජීවත් වන අවිධිමත් පදිංචිකරුවක් අනෙකුත් රාජ්‍ය ආයතන හා සම්බන්ධ වෙමින් අවශ්‍ය පහසුකම් සැලසීමට ද,

4. සභාබල ප්‍රදේශයේ ජනතාව කෙටි කලක් සඳහා අප මෙහි භාරකරුවන් හැටියට තෝරා පත්කර ගැනිමින් අප වෙත පැවරු වගකීම සභාබල ප්‍රදේශයේ සිටින සෑම තරාතිරමකම ජන කොටස් කෙරෙහි අප අපගේ අවධානය යොමු කල යුතුව ඇත. මෙහිදී විශේෂයෙන්ම වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජීවත්වන වරප්‍රසාද නොලත් ජනතාවට ජන ජීවිතය නංවාලීමට කටයුතු කළ යුතුය.

5. අඩු ආදායම් ලාභීන්ට පහත සඳහන් සේවා සැපයීමේ දී පහත සඳහන් පරිදි සහන සැලසීමට කටයුතු කළ යුතුය.

   - ❖ ගලි බවුසර් සේවා සැපයීමේ දී 40% - 50% අතර ගාස්තු සහන ලබා දීම
   - ❖ ආදාහනාගාර සේවා සැපයීමේදී 30% - 40% අතර ගාස්තු සහන ලබා දීම

එසේම ඉන්න හිටින්නට තමන්ගේම කියා සුදුසු ස්ථානයක් නොමැතිව අවම පහසුකම් යටතේ තම ජීවිකාව ගෙනයන අවිධිමත් පදිංචිකරුවන්ද අන් අයගේ පිහිටෙන් යැපෙන ස්වාධීනව යමක් කරගැනිමට අපහසු විශේෂ අවශ්‍යතා සහිත (ආබාධිත) පුරවැසියන්ද, එදිනෙදා ජීවිකාව ගෙනියන්නටත් ඒ තුළින් තම ගෙදර දොරේ අවශ්‍යතාවයන් සරිකර ගන්නටත් වෙහෙසෙන තමන්ට කියා ශක්තිමත් ආර්ථිකයක් නොමැති බල ප්‍රදේශය තුළ විසිරි සිටින ජංගම සහ සංචාරක වෙළඳුන් ද, එක් පසෙකින් මහ මුහුද හා සම්බන්ධ වන අපගේ බල ප්‍රදේශය වෙරළ ආශ්‍රිත වෙසෙන ධීවර ප්‍රජාව ඇතුළු අවතැන් වූ ජනතාව සවිබලගැන්වීමට හැකි ලෙසත්, ක්‍රියාවට නැංවිය හැකි වේවා යැයි අරමුණින් යුතුව මෙම අභ්‍යන්තර ප්‍රතිපත්ති මාලාව සකස් කොට ඒ සඳහා ගමේ ආණ්ඩුවේ අනුමැතිය ලබාගෙන ඔවුනට අත්වැලක් වන අටියෙන් මෙම ප්‍රතිපත්ති මාලාව සකස් කිරීමට කටයුතු කරන ලදි.

# ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට විශේෂ අවශ්‍යතා විධි විධාන පිරිනැමීම සඳහා වන ප්‍රතිපත්ති.

**ජ්‍යෙෂ්ඨ පුරවැයන් යනු වර්තමානයේ අප භුක්ති විඳින වරප්‍රසාද හා ප්‍රතිලාභ අප වෙනුවෙන් ඉතිරි කවරන්නට අතීතයේ කැපවීම් සිදු කළ අපගේ වටිනා මානව සම්පත බවට මෙම සභාව පිළිගන්නවා ඇත.**

## ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට වියපී රේඛ විධි විධාන පිරිනැම්ම සඳහා අදාල නෛතික විධි විධාන

(අ) 2000 අංක 9 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරිමේ පනත

1. ඒ අනුව අපි අපගේ පාලන ක්‍රියාවලිය හා මෙහෙයුම් ක්‍රියාවලිය සඳහා සැමවිටම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ උපදෙස් හා මහපෙන්වීම් ද වටිනා අදහස් හා යෝජනාද ලබා ගත යුතු බවටත්, ඊට ඉඩකඩ සැලසීම වස් සභාවේ උපදේශක කමිටු වලට ඔවුනගේ නියෝජනත්වයක් ලබා දීම සුදුසු බවට පිළිගනි.

2. සේවාලාභියෙකු හැටියට අප වෙත පැමිණෙන ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අවශ්‍යතා කඩිනමින් විමසා බලා ඒ සඳහා අවශ්‍ය පිළියම් යෙදීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් සකසනවා ඇත. මෙහිදී විශේෂයෙන්ම කාර්යාලයට පැමිණෙන ජ්‍යෙෂ්ඨ පුරවැසියන් කඩිනමින් අදාළ නිළධාරීන් හමුවට යොමු කිරීමට හෝ අවස්ථාවෝචිත පරිදි අදාළ නිළධාරියා ඔවුන් හමුවට යොමු කරවීම සඳහා කාර්යාල සහයක වරයෙකු වෙන් කර තැබීමට කටයුතු කළ යුතු බවට පිළිගනී.

3. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් පැමිණි විට ඔවුන්ට කිසියම් ලිපි කටයුත්තක් වැනි කාරණාවක් සිදු කර ගැනීමට අවශ්‍ය වූ විට ඔවුන් වෙනුවෙන් පනවා ඇති ආසන වල ඔවුන්ට වාඩි වීමට ඉඩ හැර අවශ්‍යතාවය විමසා බලා කඩිනමින් කටයුතු කිරීමේ වගකිම ඒ ඒ අංශ වල අංශ ප්‍රධානීන්ට පැවරීම කළ යුතු බවට පිළිගනී.

4. පවතින නෛතික රාමුව තුළ රැඳී සිටිමින් හැකි සෑම අවස්ථාවකම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අවශ්‍යතා මිලක් අය නොකර ඉටු කර දීම සුදුසු බවට පළින්නවා ඇත. උදාහරණ - ලිපියක පිටපතක් ලබාදීම, අවශ්‍යතා සඳහා දුරකථන ඇමතුමක් ලබාදීම, නොමිලේ ඉටුකර දීම දැක්විය හැකිය.

5. සභාවේ අයවැය සම්පාදනය සැලසුම් සම්පාදනය ප්‍රතිපත්ති සම්පාදනය, වැනි ක්‍රියාවලදී අනිවාර්යයෙන්ම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සම්බන්ධතාවය ලබා ගැනීමට හැකි සෑම විටකම පියවර ගත යුතු බවට ප්‍රතිපත්තියක් ලෙස පිළිගන්නවා ඇත.

6. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් යනු මෙම සමාජ පරිසරය තුළ අප විසින් හැකිතාක් දුරට ඉහළට ඔසවා තැබිය යුතු පිරිසක් බව අප පොදුවේ පිළිගන්නවා ඇත.



# <u>වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ පරිසර ප්‍රතිපත්තිය</u>

**නිකසල පරිසරයක් තුළ ජනිත වන්නා වූ වටපිටාවක ගහට කොළට, සතා සිවුපාවාට ඇලට - දොළට ආදරය කරන සමාජයක් ගොඩනංවමින් ඒ තුළින් නිරෝගීමත් පිරිසකට පහස දෙන හෙට උපදින මතු පරපුරට හරිත පරිසරයක උරුමය ලබාදෙන්නට හැකි සැලසුම් සහගත ප්‍රවේශයකට සැමවිටම අනුගත කටයුතු කරන වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ සභා බල ප්‍රදේශය තුළ පහත කරුණු ඉටුවිය යුතු බවට ප්‍රතිපත්තියක් ලෙස පිළිගන්නවා ඇත.**

## පරිසර ප්‍රතිපත්ති ප්‍රකාශයට අදාල නෛතික විධි විධාන

(අ) 1990 අංක 12දරණ වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය

01. වෙන්නප්පුව සභාවේ සභා බල ප්‍රදේශය හරිතවත් කලාපයක් බවට පත් කරලීම සදහා සභාව සතු භූමිවල, මාර්ග දෙපස, පොදු ඉඩම්වල, සුසාන භූමිවල, හිස් භූමිවල, පෞද්ගලික ඉඩම්වල, වැව් තාවුලුවල, ජල රක්ෂිතවල, ජල පෝෂිත පෙදෙස්වල, වැව් ඇලදොල ගංගා ආශ්‍රිතව ශාක සභාවේ මැදිහත්වීම මත සිටු වීම. එවැනි කටයුතු වල යෙදෙන පෞද්ගලික අංශයට, ප්‍රජා සංවිධාන වලට, රාජ්‍ය ආයතනවල නියෝජකයන්ට ද ඉඩක් වෙන්කර දෙමින් ඒ සැමගෙන් සමන්විතව එම තාක්ෂණික කමිටුව පත් කරලීමත් සුදුසු බවට එකග වේ.

02. සභා බල ප්‍රදේශය තුළ සියළු සංවර්ධන ක්‍රියාකාරකම් පරිසර හිතකාමි ලෙස සිදුවන බවට වගබලා ගැනීම පිණිසක් සභාව විසින් පරිසර හා පොදු පහසුකම් කමිටුවක්ද, පරීක්ෂාව, උපදේශනය සඳහා පරිසර තාක්ෂණික කමිටුවක් ද පත්කරලීම සිදු කළ යුතු බවටත් ඒ සඳහා පරිසර කටයුතු හා සම්බන්ධව අනිකුත් රාජ්‍ය ආයතනවල නියෝජනයන්ටද ඉඩක් වෙන්කර දෙමින් ඒ සැමගෙන් සමන්විතව එම තාක්ෂණික කමිටුව පත්කරලීමත් සුදුසු බවට එකඟ වේ.

03. සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක ප්‍රජා මණ්ඩල, අනිකුත් ප්‍රජාමූල සංවිධාන සම්බන්ධ කර ගනිමින් පරිසරය ආරක්ෂා කරවීමේ වැඩසටහනක් ගම් මට්ටමින් ක්‍රියාත්මක කරවීමට සභාවේ කාර්ය මණ්ඩලය හා සභාව නියෝජනය කරන මහජන නියෝජිතයින් එක්ව කටයුතු කිරීම සුදුසු බවටද ඒ සදහා යාන්තරණයක් සැකසීම කළ යුතු බවට ද එකඟ වේ.

04. සභා බල ප්‍රදේශයේ මාර්ග, වීථි, පොදු ස්ථාන පොලිතින් වැනි ජීර්ණය නොවන ද්‍රව්‍ය යොදා ගෙන සැරසිලි සිදු නොකළ යුතු බවටත් සිදු කරනු ලබන ඕනෑම සැරසිල්ලක පරිසර හිතකාමි බව තීරණය කරලීම සඳහා සභාවට යොමු කරවා පූර්ව අනුමැතිය ගත යුතු බවටත් එකඟ වේ.

05. සභා බල ප්‍රදේශය තුළ කරනු ලබන සියළුම ප්‍රචාරන ක්‍රියාවන් සඳහා අවශ්‍ය දැන්වීම් පුවරු සභාව විසින් ස්ථානගත කරදීමටත් එම ස්ථානවල හැර කරනු ලබන සියළු ප්‍රචාරක දැන්වීම ආදිය ඉවත් කරලීම කළ යුතු බවටත් එකඟවනවා ඇත.



**වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ අවශ්‍යතා සඳහා ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමේදි විශේෂ අවධානය යොමු කල යුතු සමාජ කොටස් සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතු බවත්, ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී පහත ප්‍රතිපත්තීන්හි පිහිටුවා කටයුතු කිරීමටත් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව කටයුතු කිරීම සිදුකළ යුතුව ඇත**

## ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාල නෛතික විධි විධාන

(අ) රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

01. නියමිත ක්‍රමවේදය අනුව භාෂා ත්‍රිත්වයෙන් යුතු පුවත්පත් දැන්වීම් පළ කිරීමෙන් පසු අදාල කාල සීමා තුල ඉදිරි වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

02. ලියාපදිංචි සියලුම සැපයුම්කරුවන් වෙතින් එක් එක් කාණ්ඩ යටතේ එම භාණ්ඩ සඳහා මිල ගණන් කැඳවිය යුතුය.

03. යම් භාණ්ඩ සඳහා මිල ගණන් ලබා ගත් පසු ඒ සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති දේශීය නිෂ්පාදකයන්ගේ අයිතම සඳහා විශේෂ අවධානයක් යොමුකර ප්‍රමුඛතාවය ලබා දීම.

04. සභා බල ප්‍රදේශයේ වෙසෙන විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් විසින් පවත්වාගෙන යන ව්‍යාපාරික ස්ථානයන් හි නිෂ්පාදනයන් සභාවේ අවශ්‍යතා අනුව ප්‍රමුඛතාවය ලබා දී, මිලදී ගැනීමට කල යුතු බව.

05. කාන්තාවන් විසින් පවත්වා ගෙන යනු ලබන ව්‍යාපාරික ස්ථාන වලින් ද මිල ගණන් ලබා ගැනීම සහ මිලදි ගැනිමේ දී ප්‍රමුඛතාවය ලබා දීම සිදුකළ යුතු බව ද ප්‍රතිපත්තියක් ලෙස සලකා කටයුතු කිරීම සිදු කල යුතුය.

06. මිලදි ගැනිම සඳහා ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වී නොමැති නමුත්, තම නිෂ්පාදනයන් සඳහා මිල ගණන් ලබා දීමේ අවස්ථාව කාන්තා හා විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් වෙත ලබා දිය යුතු බව

07. අඩු ආදායම්ලාභි පවුල් වල සාමාජිකයින් විසින් නිපදවනු ලබන නිෂ්පාදන වල තත්ත්වය පරීක්ෂා කර බලා අවශ්‍යතාවය අනුව මිල ගණන් ලබා ගැනිමටත් මිලදී ගැනීමේ දී ප්‍රමුඛතාවය ලබා දීමටත් කටයුතු කලයුතු බව.



# ජල හා සනීපාරක්ෂක ප්‍රතිපත්තිය - වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

**බල ප්‍රදේශයේ ජනතාවගේ කායික, මානසික, සමාජීය වශයෙන් යහපැවැත්ම ආරක්ෂා කිරීම වැඩි දියුණු කිරීම, සඳහා බල ප්‍රදේශය තුළ පවතින පොදු අධිකාරිය පළාත් පාලන ආයතනයක නිසා වන බැවින්, පහත සඳහන් පරිදි කටයුතු කිරිම සුදුසු වේ.**

## ජල හා සනීපාරක්ෂක ප්‍රතිපත්තියට අදාල නෛතික විධි විධාන

(අ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 85 සිට 99 වගන්ති දක්වා හා අංක 114 සිට 118 දක්වා වගන්ති

(ආ) වයඹ පළාත් ජල හා සනීපාරක්ෂක ප්‍රඥප්තිය

1. බල ප්‍රදේශයේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතාව සපුරාලීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. ප්‍රජා මූළ සංවිධාන පිහිටු වීමටත් අවශ්‍ය පහසුකම් සපයමින් සහ පවතින ප්‍රජා මූල සංවිධාන දිරිමත් කිරීමත්, නළ ළිං පොදු ළිං, නාන ළිං, සහ අනෙකුත් ජල මූලාශ්‍ර සුරක්ෂිත කිරීමත්, ජල සාම්පල් පරීක්ෂාව මගින් ජලයෙහි යෝග්‍යතාව පිළිබඳ වාර්තා ලබා ගැනීමත්, ජලය නොමැති ජනතාවට පානීය ජලය බවුසර් මගින් බෙදා දීම සඳහාත් අවශ්‍ය විට මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම සඳහා අයවැය මගින් මුදල් වෙන් කිරීමත්,

2. රෝග නිවාරණය සහ රෝග ව්‍යාප්තිය පාලනය කිරීමට මැසි මදුරු උවදුරු, ජල භීතිකා සහ වෙනත් බෝ වන රෝග වැලැක්වීම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාල සමග ඒකාබද්ධව වැඩ සටහන් සිදු කිරීමත්, ඒ සඳහා අය වැය මගින් ප්‍රතිපාදන සැපයීමත්,

3. ආහාර හැසිර වීමේ ආයතන නියාමනය කිරීම සඳහා ආකාර හැසිරවීමේ ආයතන ශ්‍රේණි ගත කිරීම සහ ආහාර සාම්පල් පරීක්ෂාව වෙනුවෙන් වැඩසටහන් සැකසීම, ක්‍රියාත්මක කිරීම සහ ඒ සඳහා ප්‍රතිපාදන සැපයීමත්,

4. මාතෘ සහ ළමා පෝෂණය නැංවීම, සහ දරිද්‍රතාව තුරන් කිරීම සඳහා ආධාර සහ අනුබල ලබා දීමේ වැඩ සටහන් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමත්, ළමා හා මාතෘ සායන පහසුකම් වැඩි දියුණු කිරීමට ප්‍රතිපාදන සැපයීමත්,

5. **සුසානභූමි සහ ආදාහනාගාර විධිමත්ව පවත්වා ගැනීම සහ ඒ සඳහා ප්‍රතිපාදන සැපයීමත්, අඩු ආදායම්ලාභී පවුල්වල සාමාජිකයින්ගේ ආදාහන කටයුතු සහනදායි මිලකට ඉටුකර දීමටත්, අඩු ආදායම් ලාභීන්ට ආදාහනාගාර සේවා සැපයීමේදී 30% - 40% අතර ගාස්තු සහන ලබා දිමට කටයුතු කළ යුතුය.**

6. ජලාපවහනය, මලාපවහනය සම්බන්ධයෙන් වැඩ පිළිවෙලවල් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම. විධිමත් කාණු පද්ධතියක් නඩත්තු කිරීම සහ ගලි රථ සේවාවන් පවත්වා ගැනීමත්, වැසිකිළි තනා ගැනීම සඳහා උපදෙස් සහ ආධාර ලබා දීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමත්,



**වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ජල හා සනීපාරක්ෂක ප්‍රතිපත්තිය ලෙස සභාව විසින් පිළිගනි.**